**දිළිඳුකම පිටුදැකීමේ නැගෙනහිර පළාත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ - " බී " සංරචකය**

-----------------------------------------------------------------------------------------------------

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයනලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (යෙන්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදිකර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වී ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 විශේෂ (යෙන්) ගිණුම

------------------------

මූල්‍ය ප්‍රකාශන වලට සහ ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළදී විශේෂ (යෙන්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | ජපාන යෙන් | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 421,006 | 573,031 |
| එකතු කළා : | | |
| විදේශ විනිමය ලාභය | - | 102,768 |
| අඩු කළා : | | |
| ආපසු ගැනීම් | 421,006 | 675,799 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | - |

### 2.2 භෞතික කාර්යසාධනය

----------------------------

ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ වෘත්තීය පුහුණු වැඩ සටහන් 15 ක් යටතේ පාසැල් හැරගිය අයවලුන් 668 දෙනෙකු පුහුණු කිරීමට ව්‍යාපෘතය සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශිෂ්‍යයින් 621 දෙනෙක හෙවත් සියයට 93 පමණක් පුහුණු වැඩසටහන් නිම කර තිබුණි.

## 3. විගණන නිරීක්ෂණ

----------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2010 වර්ෂයේදී නිමවී තිබුණද, ව්‍යාපෘතිය නිම කිරීමේ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. රු.573,031 ක්වූ වියදම් විශේෂ යෙන් ගිණුමෙන් ආපසු ගැනීමේදී අසාමාන්‍ය ප්‍රමාදයක් පැවති බැව් නිරීක්ෂණය වූ අතර, එය ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් 2008 වර්ෂයේදී දරා තිබුණි.